[illegible] /All Rights Reserved ]



## ජාතික අධ්‍යාපන ආයතනය

## විභාග දෙපාර්තමේන්තුව

රහසයයි

ලකුණු දීමේ පටිපාටිය

**විභාගයේ නම :- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව අවසාන පරීක්ෂණය - 2019**

ප්‍රශ්න පත්‍රයේ නම : ඉගැන්වීමේ ශිල්ප ක්‍රම - **PE /180/ PE780**

### I කොටස

එක් පිළිතුරකට එක් ලකුණ බැගින් 1 × 20 = ලකුණු 20 යි.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 1 | 1 |
| 2 | 2 |
| 3 | 3 |
| 4 | 4 |
| 5 | 2 |
| 6 | 2 |
| 7 | 3 |
| 8 | 4 |
| 9 | 2 |
| 10 | 2 |
| 11 | 4 |
| 12 | 1 |
| 13 | 1 |
| 14 | 4 |
| 15 | 3 |
| 16 | 1 |
| 17 | 1 |
| 18 | 2 |
| 19 | 1 |
| 20 | 3 |

## II කොටස

තෝරා ගත් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය. එක් පිළිතුරකට ලකුණු 16 බැගින් 16 × 5 = මුළු ලකුණු 80

'අ' කොටසින් එක් ප්‍රශ්නයකටත් 'ආ' කොටසින් ප්‍රශ්න හතරක් සඳහාත් පිළිතුරු සැපයිය යුතු ය.

සෑම ප්‍රශ්නයක් සඳහා ම පහත පරිදි ලකුණු හිමිවේ.

| | | | |
|---|---|---|---|
| I | කොටස ලකුණු | 03 | යි |
| II | කොටස ලකුණු | 05 | යි |
| III | කොටස ලකුණු | 08 | යි |
| | මුළු ලකුණු | 16 | යි |

## 'අ' කොටස

01 (i) දාර්ශනික සාධක
මනෝවිද්‍යාත්මක සාධක
ජාතික හා ගෝලීය අධ්‍යාපන අරමුණු
විෂය අරමුණු

(කරුණු 03 ක් නම් කර ඇත්නම් එකකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි.)

(ii) ඉගෙනුම් න්‍යාය හා සබැඳි ප්‍රවේශ සමග ඉගැන්වීම් ක්‍රම සම්බන්ධ වන ආකාරයට අදාළ උදාහරණයක් දැක්විය යුතු ය.

05.

i.

- විෂය කරුණු වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කළ හැකිවීම
- පන්ති පාලනය පහසු වීම
- පූර්ව සූදානමක් අවශ්‍ය නොවීම
- සම්පත් /ආධාරක අවශ්‍ය නොවීම

(කරුණු 03 කට ලකුණු 03 යි.)

ii.

- සිසුන්ට සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත නොහැකි වීම
- පාඩම අතරමග සිසුන්ට ඇතිවන ගැටලුවලට විසඳුමක් නො ලැබීම
- ශිෂ්‍ය අවධානය ගිලිහී යාම
- නිෂ්ක්‍රීය ඉගෙනුමක් සිදු වීම (ඇසීමෙන් පමණක්)
- දැනුමට පමණක් සීමාවීම
- මතක තබා ගැනීමේ ගැටලු

(කරුණු 5 කට ලකුණු 05 යි.)

iii.

- පාඩමක් නම් කිරීමට (ලකුණු 01 යි)
- පාඩමට අදාළ දේශනය පියවරවලට වෙන් කර ගැනීම (ලකුණු 01 යි)
- ඒ ඒ පියවරවලට ගැළපෙන ලෙස ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම් කිරීමට යොදා ගත හැකි ආධාරක සහ ඒවා යොදා ගන්නා ආකාරය පැහැදිලි කිරීම
- සිසුන් කණ්ඩායම්වල/යුගල ක්‍රියාකාරකම්වලට යොමු කිරීම
- පියවරවල දී උගත් කරුණු සිසුන්ට තනිව සටහන් කර ගැනීමට අවස්ථාව දීම

(ක්‍රියාමාර්ග තුනට ලකුණු 03 යි)

- උදාහරණ සහිත පැහැදිලි කිරීමට

(ලකුණු 03 යි)

(මුළු ලකුණු 08 යි.)

06.

i.

- ගැටලුවක් / මතවාදයක් (Issue) ඉලක්ක කර ගැනීම
- ශිෂ්‍ය කේන්ද්‍රීය වීම
- ස්වයං මෙහෙයුම් ඉගෙනුම
- ප්‍රත්‍යවේක්ෂණය
- ගුරුවරයා පුසාධ්‍යකරණයේ යෙදීම

(කරුණු 03 කට ලකුණු 03 යි.)

ii.

- සිසුන් කුඩා කණ්ඩායම් (5 -8) වශයෙන් සැකසීම,
  සිසුන් විසින් ගැටලුව හඳුනා ගැනීම — 1
- දැනට තමන් තුළ ඇති දැනුම සම්බන්ධ කර ගනිමින් කළ යුතු දෑ තීරණය - 2
- තනි තනි ව සිසුන් තම ක්‍රියාකාරකම්වල නිරත වීම - 3
- කණ්ඩායම් සාකච්ඡාව
  ගැටලු සම්බන්ධ නව ඉගෙනුම් සමෝධානය කිරීම — 4
- අවශ්‍ය මග පෙන්වීම්, පහසුකම් ගුරුවරයා විසින් සැකසීම - 5

(ප්‍රධාන පියවර පහ දැක්වීමට ලකුණු 05 යි.)

iii.

- ගැටලු පාදක ඉගෙනුමක් සඳහා උචිත පාඩමක් තෝරා ගැනීම සහ ඉගෙනුම් ඵල දැක්වීම

(ලකුණු 02 යි)

- ඉගෙනුම් ඵල අත්පත් කර ගැනීමට කණ්ඩායම් වැඩ, ස්වයං මෙහෙයුම් ඉගෙනුම් ක්‍රියාකාරකම් දක්වා තිබීම

(ලකුණු 04 යි)

- පියවර 05 ට අනුව පැහැදිලි කිරීමට

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි.)

02. i සමානකමක් - මූලික න්‍යායාත්මක පදනම පොදු වීම

වෙනස්කමක් - විෂය /නිපුණතාව /නිපුණතා මට්ටම / ඉගෙනුම් ඵල ළඟා කර ගැනීමට විෂය අන්තර්ගතය තෝරා ගැනීම, අනුපිළිවෙළ සැකසීම, ක්‍රම හා ශිල්පීය ක්‍රම නිර්ණය කිරීම සුවිශේෂී වීම.

(සමානකමට ලකුණු 1 යි)

(වෙනස්කම සඳහා ලකුණු 2 යි)

(මුළු ලකුණු 03 යි.)

ii සාධක 05 ක් දැක්වීම අවශ්‍යයි.

- විෂය අරමුණු /විෂයයේ ස්වභාවය /ඉගෙනුම් ඵල
- විෂය අන්තර්ගතයට / පාඩමට උචිත බව
- සිසුන්ගේ පරිණතිය හා බුද්ධි මට්ටමට උචිත බව
- නියමිත කාලය තුළ ක්‍රියාත්මක කළ හැකිවීම
- සාධනයට පහසුබව
- ඉගෙනුම සඳහා ශිෂ්‍ය සහභාගිත්වය

ඉහත කරුණු හෝ සමාන කරුණු දක්වා ඇත්නම් ලකුණු දෙන්න .

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 05 කට ලකුණු 05 යි)

iii පාඩමක් / පාඩම් ඇසුරින් උදාහරණ දැක්වීම අවශ්‍ය ය. එක් විෂයයක් ආශ්‍රිතව එක් ශ්‍රේණියකින් හෝ ශ්‍රේණිවලින් පාඩම් 3 ක් තෝරා ගත හැකි ය. (ලකුණු 03 යි)

තෝරා ගත් පාඩම් ආශ්‍රිතව උදාහරණ දක්වමින්

ක්‍රමයේ / ක්‍රමවල අසාර්ථක බව

ඉගෙනුම් ඵල සාධනය

ශිෂ්‍ය සහභාගිත්වය

ගුරු කාර්යය පහසු කිරීම

ආදී කරුණු මතු කරමින් කරුණු දැක්වීම අවශ්‍ය ය.

(හේතු තුනක් දැක්වීමට ලකුණු 03 යි)

(විග්‍රහ කිරීමට ලකුණු 02 යි)

04

i. ගුණාංග

- ශ්‍රේණි කිහිපයක සිසුන් එක් කොට එක් පන්තියක් ලෙස සැකසීම
- පන්තිය නැවත ශ්‍රේණි / ශිෂ්‍ය මට්ටම අනුව කණ්ඩායම් කිරීම
- කණ්ඩායම් සඳහා විවිධ පැවරුම් /ක්‍රියාකාරකම් තිබීම
- පන්ති කාමරය ශිෂ්‍ය මට්ටම් අනුව එක ම පන්තියක ස්ථාන ගත කිරීම
- ගුරුවරයාගේ ස්ථානගතවීම / සැරිසැරීම
- එක ම සම්පතක් විවිධ ආකාරයට භාවිතය

(කරුණු 03 කට ලකුණු 03 යි )

ii.

- පාසලේ ප්‍රමාණවත් ගුරුවරුන් නොමැතිවීම
- ගුරුවරුන් කිහිප දෙනෙකු එකවර නිවාඩු ගැනීම
- රාජකාරි කටයුතු සඳහා ගුරුවරු බැහැර වීම (සම්මන්ත්‍රණ /සැසි)
- භෞතික සම්පත් හිඟය
- අවතැන්/ සරණාගත වීම වැනි විශේෂ අවස්ථාවල දී

(කරුණු 5 කට ලකුණු 05 යි.)

iii.

- විෂයයක පාඩමක් ආශ්‍රිත ව උදාහරණ දැක්වීම (ලකුණු 01 යි)
- ශිෂ්‍ය හැකියා මට්ටම් අනුව ඒ ඒ කණ්ඩායම්වලට යොදා ගන්නා අභ්‍යාස / ක්‍රියාකාරකම් දැක්වීම

03.

i.

- පුද්ගලයින් - ජනශ්‍රැතයේ ප්‍රවීණයින් (කෘෂි , වෛද්‍ය , කාර්මික , අධ්‍යාපන ආදී)
- ආයතන - සේවා ආයතන
  රෝහල් ,අධිකරණ, පොලිස, වැනි සේවා ආයතන හා කම්හල්
  වැඩ බිම් වැනි ආයතන

( )

ii.

- විෂය ආශ්‍රිත ව, නිපුණතා දැක්වීම
- නිපුණතාව යටතේ වන පාඩමක් දැක්වීම
- පාඩම යටතේ යොදා ගැනෙන ඉගෙනුම් ඉගැන්වීම් සම්පත් (ස්වාභාවික/නිර්මිත/සමාජ) පාඩමට අදාළ වන සේ එකක් සඳහන් කිරීම

( )

iii. උදා :

ආධාරකය -මතු කිරීමට අපේක්ෂිත විෂය කරුණු සහ ආධාරකය යොදා ගන්නා ආකාරය සහ අවස්ථාව දැක්වීම, භාවිත කරන්නන් දැක්වීම (ගුරු - සිසු)

(පාඩමට ලකුණු 01 යි)

(ආධාරකය නම් කිරීමට, උචිත බවට ලකුණු 01 යි)

ආධාරකය භාවිත කරන ඉහත කරුණු අන්තර්ගත වන සේ විස්තරාත්මක ව පැහැදිලි කිරීමට

(ලකුණු 06 යි.)

(මුළු ලකුණු 08 යි.)

iii

- විෂයය හා තෝරාගත් පාඩමට (ලකුණු 01 යි.)

- එම පාඩම සඳහා ගුරු කේන්ද්‍රීය ක්‍රමයක් සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමයක් මගින් දැක්වීමට

  (ලකුණු 02 යි.)

  දක්වන ලද ක්‍රම දෙක ඇසුරින් පාඩම ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි බලපෑම් ක්‍රම දෙකට අදාළ ව වෙන් වෙන් ව හෝ සංසන්දනාත්මක ව කරුණු දැක්වීම අවශ්‍ය ය.

- ඉගෙනුම් ඵල සාධනය සඵලවීමට / දුර්වල වීමට තෝරාගත් ක්‍රමවල බලපෑම

  (ලකුණු 02 යි.)

- පාඩම ඉගෙනුම සඳහා ශිෂ්‍ය සහභාගිත්වය සක්‍රියවීමට / අක්‍රියවීමට උදාහරණ දැක්වීම

  (ලකුණු 02 යි.)

- පැහැදිලි කිරීමට

  (ලකුණු 01 යි.)

(මුළු ලකුණු 08 යි.)